# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2024 ජුනි මස 20 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2024.06.26 දින නිකුත් කරන ලදී)**


# මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)

**මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නීතිඥ මධුර විතානගේ මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 18.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ)

## මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

'' මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමය'' යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද;

එකී සංගමය පිහිටුවන ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2024 අංක    දරන මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමය සංස්ථාගත කිරීම

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු ''සංගමය'' යනුවෙන් සඳහන් කරනු ලබන) මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු ''සංස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමය යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තවද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, බලය සහ අධිකාරය එකී සංස්ථාවට තිබිය යුතු ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ

**3.** (1) සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතුය:-

(අ) මානව සම්පත් වෘත්තිකයන් සිය කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීමේ දී ඒ ආශ්‍රිතව පැන නගින ගැටලු විසඳා ගැනීම පිණිස, ඔවුන්ට සහය දැක්වීම සඳහා, තොරතුරු මූලාශ්‍රයක් වශයෙන් කටයුතු කිරීම;

(ආ) අදහස් රැස්කර ගැනීමට, ඒවා මිත්‍ර ලීලාවෙන් ප්‍රකාශ කිරීමට සහ හුවමාරු කර ගැනීමට, මානව සම්පත් වෘත්තිකයන් සඳහා සංවාදශීලී සභාවක් වශයෙන් සේවය කිරීම;

(ඇ) වඩාත් යහපත් මානව සම්පත් පරිචයන් ප්‍රවර්ධනය කිරීම උදෙසා වාර සඟරා, පත්‍රිකා සහ ශාස්ත්‍රීය ලිපි පළකිරීම සහ යම් වෙනත් ආකාරයේ සන්නිවේදන ක්‍රම භාවිතා කිරීම;

(ඈ) රජයේ, පෞද්ගලික අංශයේ, ජාත්‍යන්තර නියෝජිතායතන හා අනෙකුත් මානව සම්පත් සඳහා වන ආයතනයන්හි ඉල්ලීම පරිදි, එම ආයතන සඳහා පර්යේෂණ ව්‍යාපෘති බාරගැනීම, සම්මන්ත්‍රණ, වැඩමුළු හා වැඩසටහන් සංවිධානය හා ප්‍රවර්ධනය කිරීම තුළින් මානව සම්පත් විද්වතුන් සඳහා පුහුණු හා සංවර්ධන සහය ලබාදීම;

(ඉ) ශ්‍රී ලංකාව තුළ හා ඉන් පිටත පිහිටුවා ඇති මානව සම්පත් සංවිධාන සමඟ අවබෝධය, මිත්‍රත්වය හා සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම;

(ඊ) ශ්‍රී ලංකාව තුළ හා ඉන් පිටත සිදුවන මානව සම්පත් සංවර්ධන කටයුතු හා කාර්මික සබඳතා යන ප්‍රධාන අංශ සම්බන්ධයෙන් සහයෝගීව ක්‍රියාකිරීමට හෝ උපාය මාර්ගික සන්ධාන පිහිටුවා ගැනීමට හෝ වෙනත් සංවිධාන, මූල්‍යමය ආයතන හෝ රාජ්‍ය නොවන සංවිධාන සමඟ වෙනත් කිසියම් ආකාරයකින් වූ සහයෝගීතාවයන් ගොඩනගා ගැනීම;

(උ) මානව සම්පත් විෂයය සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය සහයෝගය, සහාය, තොරතුරු හුවමාරු කර ගැනීම හා උපදේශනය ඇති කිරීම සඳහා සුදුසු ජාල පද්ධතියක් ගොඩනැගීම තුළින් එහි දියුණුව හා සංවර්ධන සැලසීම;

(ඌ) ඉහත සඳහන් පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍ය අනුෂාංගික හෝ හිතකර වෙනත් සියලු දේ සිදු කිරීම.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය, උපන් ස්ථානය හෝ වෙනයම් හේතුවක් පදනම් කරගත් වෙනස්කමකට භාජනය නොවන පරිදි ක්‍රියාත්මක කිරීමට සංස්ථාව වගබලා ගත යුතු ය.

ආණ්ඩුවේ හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කාර්ය සමඟ සංස්ථාවේ කාර්ය ගැටුම් සහගත නොවන බවට සංස්ථාව සහතික විය යුතු බව

**4.** ආණ්ඩුවේ හෝ පළාත් සභාවක යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් සමගාමීව පවත්වාගෙන යනු ලබන යම් කාර්යයක් සහ සංස්ථාවේ කාර්ය අතර කිසිදු ගැටුමක් නිර්මාණය නොවන ආකාරයෙන් සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කළ යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම

**5.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය, මේ පනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි ධුර දරන්නන් යම් සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින්මතු ''කමිටුව'' යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ කමිටුව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (අ) මෙම පනත ආරම්භ වන දිනයට පෙරතුවම වූ දිනයේදී ධුර දරනු ලැබූ සංගමයේ කමිටුව, 7 වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට සංස්ථාවේ ප්‍රථම කමිටුව පත්කරනු ලබන හෝ තෝරා පත්කරනු ලබන තෙක් සංස්ථාවේ කමිටුව වශයෙන් ක්‍රියා කළ යුතු ය.

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට වසරක් ඇතුළත සංස්ථාවේ පළමු කමිටුව පත්කිරීම හෝ තෝරා පත්කර ගැනීම කළ යුතු ය.

(3) (අ) අනුශාසකවරු හා උපදේශකවරුන් ද ඇතුළුව කමිටුවේ ධුර දරන සෑම ධුර දරන්නෙකුම, වර්ෂ තුනක කාලයක් සඳහා පත්කර ගත යුතු හෝ තෝරා පත් කර ගත යුතු අතර, එම වර්ෂ තුනක කාලසීමාව ඉකුත් වීමෙන් පසුව එම ධුර දරන්නා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත පත්කිරීම හෝ තෝරා පත්කිරීම සඳහා සුදුස්සෙකු වන්නේ ය.

(ආ) යම් ධුර දරන නිලධාරියෙකු මියයාම, ඉල්ලා අස්වීම, නොහැකියාවකට පත්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවකදී කමිටුව විසින් සංස්ථාවේ රීති සැලකිල්ලට ගෙන, එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තෙකු පත් කර ගැනීම හෝ තෝරා පත්කර ගැනීම සිදු කළ යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ පත්කර ගනු ලබන හෝ තෝරා පත්කර ගනු ලබන හෝ තැනැත්තා, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉතිරිව ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(4) සංස්ථාවේ කටයුතු පරිපාලනය කරන කමිටුව විසින්, සංස්ථාවේ සාමාජික ලැයිස්තුවක් තබා ගැනීමට කටයුතු කළ යුතු ය. එම ලැයිස්තුවේ මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී සංගමයේ සාමාජිකයින් වන සෑම පුද්ගලයෙකුගේ ම නම් මෙන්ම, එතැන් සිට නිසි පරිදි සංගමයේ සාමාජිකයෙකු ලෙස ලියාපදිංචි කර ගන්නා සෑම පුද්ගලයෙකුගේ ම නම් ද ඇතුළත් විය යුතු ය.

සංස්ථාවේ බලතල

**6.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය හෝ නංවාලීම සඳහා පහත සඳහන් අවශ්‍ය හෝ අපේක්ෂිත සියලු ක්‍රියා හා කාරණා කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ සහ ඉටු කිරීමේ බලය සංස්ථාවට තිබිය යුතු ය :-

(අ) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිල දී ගැනීම, අත්කර ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම සහ අළුත්වැඩියා කිරීම සහ අන්‍යාකාරයකින් ලබා ගැනීමට සහ සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව සුදුසු යැයි සැලකෙන අයුරින් ඒවා සම්බන්ධයෙන් ක්‍රියාකිරීම හෝ ඒවා බැහැර කිරීම;

(ආ) ඇප සහිතව හෝ රහිතව ණයට ගැනීම හෝ රැස්කිරීම සහ මුදල් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද, සංස්ථාව වෙත ලබාදෙනු ලබන විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් කමිටුව විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ සහ කලින් කලට අදාළ වන්නාවූ සියලුම අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වෙතින් පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගණුදෙනු කළ හැකි සාධන පත්‍ර සකස් කිරීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් දීමට, පිටසන් කිරීමට, ගණුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට සහ නිකුත් කිරීමට සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පවත්වාගෙන යාමට සහ වැසීමට;

(ඈ) සංස්ථාවේ කාර්යයන් සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල්, කමිටුව විසින් තීරණය කරනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීමට;

(ඉ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ඉඩම් හෝ පෞද්ගලික දේපළකට බලපාන්නා වූ යම් නීතිමය භාරයක් හා කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පරිපාලනය කිරීමට;

(ඊ) සංස්ථාවේ සේවා නියුක්තිකයන් පත්කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහකිරීම හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයෙහි, විනය පාලනය පවත්වාගෙන යාම සහ සංස්ථාව විසින් තීරණය කරන ලද වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීම; සහ

(උ) සංස්ථාවේ පරමාර්ථ නිසි ලෙස සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ සුදුසු වෙනත් සියලු දේ සිදු කිරීම.

සංස්ථාවේ රීති

7. (1) සංස්ථාව විසින් සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියට අනනුකූල නොවන රීති, පහත සඳහන් සියලු කරුණු හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල විය යුතු ය:-

(අ) සාමාජිකයින් වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු;

(ආ) කමිටුවේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ පත්වීම, බලතල, කාර්ය හා කර්තව්‍ය සහ කොන්දේසි සහ නියමයන්;

(ඈ) කමිටුවේ හෝ එහි යම් අනු කමිටුවක රැස්වීම් කැඳවීමේ දී හා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය, රැස්වීම් පිළිබඳ නිවේදන හා න්‍යාය පත්‍ර, ගණපූර්ණය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඉ) සංස්ථාවේ සහ කමිටුවේ සාමාජිකයෙකු වීමට අවශ්‍ය සුදුසුකම් සහ නුසුදුසුකම්;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම; සහ

(උ) පොදුවේ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම, එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සහ සංස්ථාව විසුරුවා හැරීම;

(2) සංස්ථාව විසින් සාදනු ලද යම් රීතියක් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

(4) මෙම වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති රජයේ ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

8. (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු ය. සංස්ථාවේ අරමුදල

(2) සංස්ථාව සඳහා සහ වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලුම මුදල්, කමිටුව විසින් අනුමත කරන ලද බැංකු එකක හෝ වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, හා ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ මුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් හා විගණනය

**9.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, විගණකාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාර විගණකාධිපතිවරයා විසින් පත්කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ ''සුදුසුකම් ලත් විගණකවරයා'' යන්නෙන්-

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) ගණකාධිකාරී ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ.

වාර්ෂික වාර්තාව

**10.** (1) කමිටුව විසින් සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂය සඳහා සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සමග වාර්තාව අදාළ වසරට පසුව එන වර්ෂයේ සය මාසයක් ඉකුත් වීමට පෙර සමාජ සේවා විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හා 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ දී සංස්ථාව වෙත දේශීය හා විදේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙනම ගිණුමක් (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාව සමග යැවිය යුතු ය.

**සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය**

**11.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භක වන දිනට පෙරාතුවම වූ දිනයෙහි පැවැති සංගමය විසින් ගෙවිය යුතු සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර එදිනට සංගමයට අයවිය යුතු සියලු ණය සහ සංගමයට ගෙවිය යුතු සාමාජික මුදල් සහ දයක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව**

**12.** මෙම පනත ක්‍රියාත්මක වීමේදී, එම සංගමයේ නමින් හෝ, එම සංගමය වෙනුවෙන් භාරකාරත්වය දරන පුද්ගලයන්ගේ නමකින් හෝ නම්වලින් සංස්ථාව සතු වන සෑම සහ සියලුම නිශ්චල සහ චංචල දේපළ, මෙයින් පිහිටවනු ලද සංස්ථාවට අයත් විය යුතු හා අයත් වන අතර, එකී දේපළ ද, එතැන් සිට මිලදී ගැනීම්, ප්‍රදාන, තෑගි, තෙස්තමේන්තු නියාදන හෝ වෙනත් යම් ආකාරයකින් අත් කර ගන්නා සියලු නිශ්චල හා චංචල දේපළ ද, සියලු දායක මුදල්, ආධාර හා පරිත්‍යාගයන් ද, මෙම සංස්ථාව විසින් දැරිය යුතු වන අතර ම, එකී සියලු දේපළ මෙම පනතේ අරමුණු සඳහා එම සංස්ථාවේ එකී කාලසීමාවේ බලපවත්නා නීතිවලට යටත්ව විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ බලය සංස්ථාව සතු වනු ඇත.

**මුදල් සහ දේපළ අදාළ කර ගැනීම**

**13.** කවර ආකාරයකින් හෝ ලබාගන්නා සංස්ථාවේ මුදල් හා දේපළ සංස්ථාවේ පරමාර්ථ ඉටු කරගැනීම කෙරෙහි පමණක් අදාළ කරගත යුතු අතර, එයින් කිසිදු කොටසක් සංස්ථාවේ සාමාජිකයින්ට ලාභාංශ මුදල්, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් සෘජුව හෝ අන්‍යාකාරයෙන් නොගෙවිය යුතු හෝ නොපැවරිය යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව**

**14.** (1) කමිටුවේ සාමාජිකයින් දෙදෙනකුගේ ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණි සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතුය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තෙකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාවේ මුද්‍රාව, කමිටුව විසින් තීරණය කරනු ලැබිය හැකි කමිටුවේ යම් ධුර දරන නිලධාරියෙකු භාරයේ තිබිය යුතු ය.

සංස්ථාව විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ

**15.** (1) සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත්කිරීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයින් අතර බෙදා දීම තහනම් කර ඇත්තා වූද, වෙනත් ආයතනයකට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා උචිත ආයතනය සංස්ථාව විසුරුවා හැරීමට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයින් විසින් සභාවේ යම් මහා සභා රැස්වීමකදී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**16.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට හෝ වෙනත් යම් පුද්ගලයෙකුගේ අයිතිවාසිකම්වලට, මේ පනතෙහි සඳහන් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**17.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.